**කැලණිය ප්‍රාදේශීය සභාව** - 2023

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කැලණිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කැළණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ඡේද 3.26 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් වටිනාකම රු.1,804,493 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂවලදී නිවැරදිව සකස් කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 3 ක ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.51,660,622 ක් වුවත්, උපලේඛන අනුව රු.57,986,132 ක් වූයෙන්, රු.6,325,510 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස සම්බන්ධයෙන් පරීක්ෂා කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |
| (ආ) | ශුද්ධ වත්කම් වටිනාකම, වත්කම් වගකීම් ප්‍රකාශය අනුව රු.3,123,804,710 ක් වුවත්, සටහන් අංක 19 අනුව රු.3,126,414,340 ක් වූයෙන් රු.2,609,630 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂ වලදී නිවැරදිව සකස් කරන බව. | එම. |

## 1.7. අනුකූල නොවීම්

### 1.7.1. නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ ) | 1946 අංක 30 දරන බදු හා තක්සේරු කරන පනත | 2009 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ වරිපනම් අය කර තිබුණි. | වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කර ඇති බව. | තක්සේරුව සිදු කරවාගෙන, නව වරිපනම් රේටයන් අනුව අයකිරීම් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ 21(3) වගන්තිය | 2017 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ, කුලී නිවැසියන් 24 දෙනෙකුට ගෙවියයුතු රු.184,809 ක් ගෙවා නොතිබුණි. | ගෙහිමියන් වෙත ලිපි යවා ඇතත්, මුදල් ලබාගෙන නොමැති බව. | ගෙහිමියන් දැනුවත් කර අදාල මුදල් ගෙවිය යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් ශේෂ 45 ක වටිනාකම රු.1,880,535 ක් අය කරගෙන නොතිබුණි. | නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 08 | මූල්‍ය ප්‍රකාශනය අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2024 මැයි 02 දින ඉදිරිපත් කර තිබුණි. | පිළිගන්නා බව. | නියෝග අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.411,945,994 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.111,371,688 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 71,951,100 | 70,179,783 | 78,214,936 | 42,836,295 | 71,000,000 | 62,635,232 | 14,462,268 | 48,998,852 |
| (ii) | කුලී | 30,160,875 | 29,956,398 | 31,737,215 | 11,446,625 | 28,175,400 | 31,913,924 | 30,789,868 | 22,830,680 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,000,000 | 1,329,862 | 1,271,269 | 58,593 | 5,700,000 | 3,426,652 | 3,426,652 | - |
| (iv) | වෙනත් ආදායම් | 418,427,700 | - | 706,017,533 | - | 8,750,000 | 13,448,854 | 13,448,854 | 733,489 |
| | | 521,539,675 | 101,466,043 | 817,240,953 | 54,341,513 | 113,625,400 | 111,424,662 | 62,127,642 | 72,563,021 |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | කල විශ්ලේෂණය අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.42,836,295 ක හිඟහිටි වරිපනම් ශේෂය තුල වසර 10 ට වැඩි ශේෂය රු.10,955,223 ක්ද, වසර 5 ත් 10 ත් අතර ශේෂය රු.11,990,480 ක්ද වී තිබුණි. | ජංගම වැඩසටහන් හා වෙනත් වැඩසටහන් මගින් අයකරමින් පවතින බව. | හිඟ වරිපනම් ශේෂයන් අයකර ගත යුතුය. |
| (ii) | හිග අදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ වරිපනම් රු.47,166,492 ක ශේෂයෙන් රු.20,273,377 ක් අයකර තිබුණු හෙයින්, අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 43 ක් වැනි පහල අගයක් ගෙන තිබුණි. | එම | එම |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඉඩම් හා ගොඩනැගිලි බදු දීම් හිඟ හිටි ශේෂය වූ රු.945,253 ක් තුල, වසර 1 ත් 3 ත් අතර පැවති රු.771,184 ක් සහ වසර 1 ට අඩුව පැවති රු.111,639 ක් 2024 මැයි 02 දින වන විටත් අය කරගෙන නොතිබුණි. | අයකර ගනිමින් පවතින බව. | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම් හිඟ හිටි ශේෂයන් අයකර ගත යුතුය. |

(ආ) කුලී

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟ වෙළඳ ස්ථාන කුලී ශේෂය වසර 5 ඉක්මවූ රු.1,714,507 ක්ද, වසර 3 ත් 5 ත් අතර රු.266,972 ක්ද වී තිබුණි. | විරෝධතා පරීක්ෂණ අනුව අය කරන බව. | වෙළඳ ස්ථාන කුලී හිඟ ශේෂයන් අයකර අයකර ගත යුතුය. |
| (ii) | වෙනත් ස්ථාන කුලී හිඟ ශේෂය, සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රු.187,193 ක් සහ වර්ෂය තුල අයකිරීම රු.15,000 ක් වීමෙන් අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 8 ක් තරම් පහල අගයක් ගෙන තිබුණි. | දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනත් ස්ථාන කුලී හිඟ ශේෂයන් අයකළ යුතුය. |
| (iii) | 2004 වර්ෂයේදී සභාව සතු උත්සව ශාලාව බදු දීමේදී ඇතිවූ හිඟ කුළිය රු.733,489 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | නඩු තීන්දුවට අවනත නොවූ පාර්ශවකරු වෙත උසාවි නියෝගයක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ කුළී ශේෂයන් අයකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රජා සංවර්ධන අංශයේ, වටිනාකම රු.18,050,000 ක් වූ ක්‍රියාකාරකම් 16 ක් ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් කාර්ය සාධනය සියයට 41 ක් වී තිබුණි. | ක්‍රියාකාරකම් 16 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | ක්‍රියාකාරී සැලස්ම අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් ක්‍රියාත්මක කරන ආදාහනාගාර 4 ක් සඳහා 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන අති විශේෂ ගැසට්පත්‍රය අනුව පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | අයදුම්පත් සහ ලියකියවිලි සම්පූර්ණ කර මධ්‍යම පරිසර අධිකාරි වෙත යවා ඇති බව. | ගැසට්පත්‍රය අනුව කටයුතු කළ යුතුය. |

3.2. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | පොල්හේන ක්‍රීඩාපිටිය තුල පවතින ශරීර සුවතා මධ්‍යස්ථානයේ ඇති ව්‍යායාම උපකරණ අයිතම 29 ක් ස්ථාවර වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගතකිරීමට කටයුතුකර නොතිබුණි. | ඉදිරියේදි උපලේඛණවලට ඇතුළත් කර ප්‍රත්‍යාගණනයට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුලත් කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අනතුරට ලක්වූ JCB යන්ත්‍රයේ ඇස්තමේන්තුගත රක්ෂණ වන්දි වටිනාකම රු.2,422,762 ක් 2024 මැයි 02 දින වන විටත් ලැබී නොතිබුණි. | අළුත්වැඩියාව අවසන් කර ප්‍රතිලාභ ලබාගැනීමට ජාතික රක්ෂණභාර අරමුදලට යවා ඇති බව. | අළුත්වැඩියාවට අදාල වන්දි මුදල් ලබා ගත යුතු අතර යන්ත්‍රය භාවිතයට ගත යුතුය. |

## 3.3. නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතු වටිනාකම රු.12,654,114 ක් වත්කම් 3 ක් වසර 5ක සිට වසර 8 ක් දක්වා පරාසයක් තුල භාවිතයෙන් ඉවත්කර තිබුණි. | යන්ත්‍ර 2 ක් වෙනත් සභාවකට ලබාදීමට පළාත් පාලන කොමසාරිස් (බ.ප) වෙතින් අනුමැතිය ඉල්ලා ඇති අතර, ඉතිරි යන්ත්‍රය අපහරණයට කටයුතු කරන බව. | වෙනත් සභාවකට පැවරීමට, වෙන්දේසි කිරීමට හෝ අපහරණයට කටයුතු කළ යුතුය. |
| (ආ) | වසර 03 ක් පමණ කාලයක සිට අක්‍රීය තත්ත්වයෙන් පවතින හුනුපිටිය පැරණි ආදාහනාගාරය පිළිසකර කරගෙන නොතිබුණි. | කැඳවූ මිල ගණන් රු.ලක්ෂ 50 ඉක්මවයි. 2024 වර්ෂයේ අළුත්වැඩියාවට කටයුතු සිදුකරමින් පවතින බව. | පිළිසකර කර භාවිතයට ගත යුතුය. |
| (ඇ) | දිරාපත් වූ අංක රහිත ටේලර් 9 ක්, අත් කරත්ත 3 ක් සහ ගලි බවුසරයක් විධිමත් පරිදි බැහැර කර නොතිබුණි. | අපහරණයට කටයුතු සිදුකරමින් පවතින බව. | භාවිතයට ගත නොහැකි වත්කම් විධිමත් පරිදි බැහැර කළ යුතුය. |

## 3.4. වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතා කරන ඉඩම් 21 කට පිඹුරුපත්ද, 76 කට හිමිකම තහවුරු කිරීමේ නීත්‍යානුකූල ලියවිලිද නොතිබුණි. | පිඹුරුපත් සකසා ප්‍රකාශණ ඔප්පු සැකසීමට කටයුතු කරන බව. | පිඹුරුපත් සකසා, හිමිකම් තහවුරු කර ගත යුතුය. |
| (ආ) | සුසාන භූමි 05 ක පවතින ගොඩනැගිලි ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුලත් කර ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කරන බව. | අදාල වත්කම් ලේඛනගත කර, ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම රු.34,000 ක යන්ත්‍ර 3 ක් භෞතිකව නොතිබුණි. | ලේඛනගතව ඇත්තේ එම යන්ත්‍රම දැයි කිව නොහැකි බව. | මූල්‍ය ප්‍රකාශන වල අයිති වත්කම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඈ) | අංක තහඩු රහිත ටේලර් 6 ක් භාවිතා කරමින් පැවතුණි. | අංක තහඩු ලබා ගැනීමට කටයුතු කරන බව. | අංක තහඩු සවිකර ගැනීමට කටයුතු කළයුතුය. |

**3.5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය තහනම් කළ, සේවය අතහැර ගිය, මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 11 දෙනෙකුගේ හිඟ හිටි සේවක ණය ශේෂය රු.1,318,990 ක් වී තිබුණි. | සේවය තහනම් කළ නිලධාරීන්ට සිහි කැඳවීම් යවා ඇති බව හා සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ඇපකරුවන් විශ්‍රාම, එතෙර ගොස් ඇති බව හා මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ පාරිතෝෂිතයන් ලැබී නැති බව. | සේවක ණය අයකර ගත යුතුය. |